# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2134/47 - 2019 අගෝස්තු මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2019.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන සංරක්ෂණ ආඥාපනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරන (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 64(1) වගන්තිය සමග කියවිය යුතු 3. වගන්තිය යටතේ වූ නියමය.

නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරන (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 3. වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පහත උපලේඛනයේ මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 38.653 ක විශාලත්වයෙන් යුතු පස්පොලකන්ද මූකලාන හෙවත් වැදිකන්ද මූකලාන වනාන්තරය වර්ෂ 2019 ක් වූ ජූලි මස 15 වැනි දින සිට පස්පොලකන්ද මූකලාන හෙවත් වැදිකන්ද මූකලාන රක්ෂිත වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි මු.පි.කැ. 3489 හි කැබලි අංක 01, 02, 03, 04, 05 සහ 06 ලෙස හඳුන්වන පස්පොලකන්ද මූකලාන හෙවත් වැදිකන්ද මූකලාන නැමති මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 38.653 ක විශාලත්වයෙන් යුතු පහත මායිම් වලින් දක්වා ඇති කැලෑ ප්‍රදේශය වේ.

*උතුරට* : මු.පි. 3906 හි කැබලි අංක 05, 04, 10ද, මු.පි.කැ. 2449 හි කැබලි අංක 01ද, මු.පි.කැ. 2696 හි කැබලි අංක 37ද, 36, 34, 35, 33, 26, 25, 24, 10, 09, 08, 11 ද ;

*නැගෙනහිරට* : මු.පි. 3906 හි කැබලි අංක 10, 12, 14 ද, මු.පි. A. 1149 හි කැබලි අංක 1, 2, 3, 4, 6, 13 ද ;

*දකුණට* : මු.පි. 1149 හි කැබලි අංක 13, 10, 11, 28 ද, මු.පි. 3906 හි කැබලි අංක 18 Aද, මු.පි. 2972 හි කැබලි අංක 01, 02 ද, මු.පි. 3906 හි කැබලි අංක 19 ද, මු.පි. 267 හි කැබලි අංක 401 ද, මු.පි. 802 හි කැබලි අංක 1 ද, මු.පි. 3906 හි කැබලි අංක 10 ද, මු.පි. 802 හි කැබලි අංක 01 ද, සහ මු.පි. 802 හි කැබලි අංක 2 ද ;

*බටහිරට* : මු.පි. 802 හි කැබලි අංක 02, 07 ද, මු.පි. 3906 හි කැබලි අංක 07 ද, ග.පි. 36656 වැලිකන්ද හෙලේ අස්වැද්දුම සහ මු.පි. 3906 හි කැබලි අංක 8.

ප්‍රමාණය : හෙක්ටයාර් 38.653

05 - 598

1A - PG 4604 — 92 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*